# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

## 2019 පෙබරවාරි - අප්‍රේල්

## සමාජීයවිද්‍යා පීඨය

### සංවර්ධන අධ්‍යයනය

### සංවර්ධන න්‍යාය සහ භාවිතය DVST – E 3015

(පැරණි නිර්දේශය)

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. රටක සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා ධනවාදී ආර්ථික සංවර්ධන ප්‍රවේශය යොදාගැනීමේ ප්‍රායෝගික යථාර්තයන් විමර්ශනය කරන්න. (ලකුණු 20 යි)

02. සෑම දෙනෙකුටම වඩා යහපත් ජීවිතයක් ලබාදීම සංවර්ධනයේ ප්‍රමුඛාර්ථය වුවත් එය තවමත් ඉටුකර ගැනීමට නොහැකි වී ඇති හේතු පරීක්ෂා කරන්න. (ලකුණු 20 යි)

03. සාධාරණ සමාජයක් ගොඩනැංවීමෙහිලා සමාජවාදී දේශපාලන ආර්ථික ක්‍රියාවලියේ භාවිතාව පිළිබඳ ඔබගේ අදහස් උදාහරණ මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 20 යි)

04. ලෝකයේ සෑම රටක්ම දිළිඳු බව පිටුදැකීමට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇතත් එය තවමත් සංවර්ධනයේ ප්‍රධාන ගැටළුව බවට පත්ව ඇත්තේ කුමන සාධක නිසාදැයි උපසහරා අප්‍රිකානු කලාපය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20 යි)

05. "ලෝකයේ රටවල් අතර පවතින සංවර්ධන විෂමතා කෙරෙහි පදනම් වන්නේ ඒ ඒ රටවල් භාවිතා කරන සංවර්ධන න්‍යායන්හි භාවිතයේ විවිධතාවයි" මෙම ප්‍රකාශය විවේචනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 20 යි)

06. රටක් තුළ පවතින සංවර්ධන විෂමතා සඳහා පාදක වන සාධක ශ්‍රී ලංකාව උදාහරණයට ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 20 යි)

07. ඩබ්ලිව්.ඩබ්ලිව් රොස්ටොව් (W.W Rostow) ඉදිරිපත් කළ ආර්ථික වෘද්ධි න්‍යාය සංවර්ධනය වන රටවලට යොදාගත හැකි ආකාරය පහදන්න. (ලකුණු 20 යි)

08. රටක සංවර්ධන අභිමතාර්ථ ළඟාකර ගැනීම සඳහා අධ්‍යාපනයේ සම අවස්ථා බිහිකිරීමේ වැදගත්කම උදාහරණ මගින් ගෙනහැර දක්වන්න. (ලකුණු 20 යි)

*************************